# සංගත සැලසුම 2009-2013

## හැඳින්වීම

1972 අංක 05 දරන ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතන පනත යටතේ 1972 වසරේ දී පෙබරවාරි 21 දින හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය ස්ථාපනය කොට ඇත. දිවංගත හෙක්ටර් කොබ්බෑකඩුව මැතිතුමා කෘෂිකර්මාන්තයේ උන්නතිය උදෙසා කළ සේවය ඇගයීම වස් 1995 පෙබරවාරි 21 දින මෙම ආයතනය හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය වශයෙන් නම් කරන ලදි. එය කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍යාංශය යටතේ ව්‍යවස්ථාපිත ආයතනයක් ලෙස ක්‍රියාත්මක වේ. ගොවිජන සහ ග්‍රාමීය අංශයේ ප්‍රතිපත්ති මූලික කොට ගත් පර්යේෂණ හා පුහුණු අවශ්‍යතා ප්‍රවර්ධනය වෙනුවෙන් මෙම ආයතනය ස්ථාපිත කෙරිණි. දේශීය ගොවිජන පර්යේෂණ අංශයේ පුරෝගාමියා වශයෙන් තිස් හත් වසරක කාල සීමාව තුළ සමාජ-ආර්ථික පර්යේෂණ හා පුහුණු කිරීම් මෙන්ම ආයතනය ස්ථාපනය කළ 1972 වසරේ සිට ගොවිජන අංශයේ සංවර්ධනය සඳහා ප්‍රතිපත්ති සම්පාදනයට අවශ්‍ය තොරතුරු සැපයීම තුළින් ලත් අත්දැකීම් සම්භාරයක් ආයතනය සතුව පවතී.

## නීතියෙන් පැවරුන කාර්ය භාරය (Mandate)

ඉහත පනතේ 3(1) වගන්තිය යටතේ ආයතනයේ කාර්ය භාරය හා සම්බන්ධ අරමුණු පහත දැක්වේ.

අ. ගොවිජන පර්යේෂණයන් පෝෂණය කිරීම, සහාය දැක්වීම, දිරිදීම සහ සහයෝගය දැක්වීම.

ආ. රජයේ දෙපාර්තමේන්තු, පළාත් පාලන ආයතන, රාජ්‍ය සංස්ථා සහ අනෙකුත් ආයතන මඟින් භාර ගනු ලබන ගොවිජන පර්යේෂණ සම්බන්ධීකරණය කිරීම.

ඇ. කෘෂිකර්ම සංවර්ධනයට බලපාන ආයතනික කරුණු පිළිබඳ විමර්ශනය කිරීම සහ පර්යේෂණ කිරීම.

ඈ. කෘෂිකාර්මික අරමුණු සඳහා ඉඩම් ආර්ථික භාවිතයට අදාළ විමර්ශන පර්යේෂණ හා අධ්‍යයන කටයුතු භාර ගැනීම.

ඉ. කෘෂිකාර්මික සහ ග්‍රාම සංවර්ධනයට අදාළ සමාජ-ආර්ථික පර්යේෂණ පැවැත්වීම.

ඊ. දේශීය හෝ විදේශීය ආයතනයන්ගේ සහයෝගය ඇතිව හෝ තනිව කෘෂිකාර්මික පර්යේෂණයන්ට සම්බන්ධ පුහුණු සහ වැඩසටහන් දියත් කිරීම, පහසුකම් සැපයීම මෙන්ම ඩිප්ලෝමා, උපාධි, ත්‍යාග සහ විශිෂ්ඨ සම්මාන ප්‍රදානයන් කිරීම.

උ. දේශීය, කලාපීය සහ ජාත්‍යන්තර තලයේ සම්මන්ත්‍රණ, අධ්‍යයන කව සහ වැඩමුළු පැවැත්වීම සහ ඒ සඳහා අවශ්‍ය අනුග්‍රහය දැක්වීම.

ඌ. ආසියානු රටවල සහයෝගීතාවය මත කලාපීය අවශ්‍යතාවන්ට සේවය කිරීම සඳහා ගොවිකටයුතු ව්‍යුහය තුළ පවතින ගැටළුවලට අදාළ පර්යේෂණ පැවැත්වීම සහ ගොවිකටයුතු ආශ්‍රිත ගැටළු පිළිබඳ කරුණු එක්රැස් කිරීමේ සහ බෙදා හැරීමේ මධ්‍යස්ථානයක් ලෙස ක්‍රියා කිරීම.

ඔ. ශ්‍රී ලංකාව සහ සෙසු ආසියානු රටවල් කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් කෘෂිකර්ම සංවර්ධනය සහ නවීකරණය සම්බන්ධ ගැටළු ඉහත සඳහන් පර්යේෂණයන්ට අදාළ කර ගැනීම.

## දැක්ම (Vision)

ගොවිජන සහ ග්‍රාමීය අංශයේ තිරසාර සංවර්ධනය සඳහා නව දැනුම ජනනය කර බෙදා හැරීමේ ප්‍රමුඛයා වීම.

## මෙහෙවර (Mission)

පර්යේෂණ හා පුහුණු කිරීම් තුළින් ගොවිජන හා ග්‍රාමීය අංශය ශක්තිමත් කිරීම.

## ඉලක්ක

- ගොවිජන ගැටළු සඳහා සමාජ-ආර්ථික පර්යේෂණ සිදු කරන විශිෂ්ටතම ආයතනය බවට පත්වීම.
- රජයේ සැලසුම් සකසන්නන්, ප්‍රතිපත්ති සම්පාදකයන්, ව්‍යාපාරිකයන් සහ පර්යේෂණ ප්‍රජාවන් සමඟ සමීප සබඳතා ඇති කර ගැනීම.

- දැනුම ජනනය කර කාලීනව බෙදහැරීම තුළින් ප්‍රතිපත්ති සම්පාදන ක්‍රියාවලිය වඩාත් කාර්යක්ෂම කිරීම.
- ජාතික ප්‍රතිපත්ති තත්ත්වයන් සම්බන්ධයෙන් ස්වාධීන තක්සේරු/ඇගයීම් ලබා දෙමින් ජනතාව දැනුවත් කිරීම.
- ආයතනයේ කාර්ය මණ්ඩලය පුළුල් කිරීම සහ ආයතනයේ දැනුම් පදනම පුළුල් කිරීම සඳහා ආයෝජනය කිරීමෙන් සමාජ-ආර්ථික ප්‍රතිපත්ති විශ්ලේෂණය කිරීමේ හැකියාව ශක්තිමත් කිරීම.

**අරමුණු**

- ප්‍රතිපත්ති සම්පාදකයන්, ගොවීන් සහ වෙළඳුන් වෙත අලෙවි තොරතුරු ප්‍රමාදයකින් තොරව නියමිත කාලයේ දී බෙද හැරීම.
- කෘෂි ප්‍රතිපත්තියේ විවිධ දෘෂ්ටි කෝණයන් හඳුනා ගැනීම.
- කෘෂිකාර්මික ගැටළු පිළිබඳ පර්යේෂණ සැලසුම් කිරීම ප්‍රමුඛතාව මත සිදු කිරීම.
- රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ සංවිධාන, විශ්වවිද්‍යාල මෙන්ම කලාපීය සහ ජාත්‍යන්තර පර්යේෂණ ආයතන/නියෝජිත ආයතන සමඟ සම්බන්ධතා ගොඩ නැගීම.
- කෘෂිකාර්මික දත්ත පදනම සම්බන්ධ ක්ෂෙත්‍රය පුළුල් කිරීම හා සවිමත් කිරීම.
- අවශ්‍ය කුශලතාවන් පුද්ගලිකව සහ සාමූහිකව අත්පත් කර ගැනීම.
- සේවයට කැප වූ, නිපුණ සහ තෘප්තිමත් සේවක කණ්ඩායමක් ඇති කිරීම.

**ක්‍රමෝපායයන්**

- පර්යේෂණ හා පුහුණු කමිටුව (RTC) සවිමත් කිරීම.
- ආයතන විෂය පථයට බැඳුනු තේමාවන්.
- විවිධ ස්වරූපයන්ගෙන් යුත් ප්‍රකාශනයන්ගේ ඒකාබද්ධ ස්වරූපය තහවුරු කිරීම. පසුතලය, මුල් කවරය, පිටු අංක යෙදීම, අකුරු වර්ග සහ හැඩයන්
- පර්යේෂණ යෝජනා සැකසීමේදී සාහිත්‍ය විමර්ශන වර්ධනය කිරීම.
- සියළු පර්යේෂණ වාර්තා ප්‍රකාශයට පත් කිරීමට අභ්‍යන්තර විමසා බැලීමකින් අනතුරුව බාහිර පාර්ශව විමසුම සඳහා සූදනම් කිරීම.
- ආයතනයේ ශාස්ත්‍රීය සභාවන්ගේ එකිනෙක කලාපයන් පිළිබඳ වගකීම ආයතනයේ ඇති අංශ වෙත පවරාදීම.
- වෘත්තීය සංස්කාරකවරයෙකුගේ සේවාව ලබා ගැනීම සඳහා බාහිර සහයෝගය ලබා ගැනීම.
- දේශීය භාෂාවන්ගේ පර්යේෂණ වාර්තා ප්‍රමාණය ඉහළ නැංවීම.
- ජ්‍යෙෂ්ඨ මට්ටමේ පර්යේෂකයන් බඳවා ගැනීම.
- එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන ඔස්සේ විදේශීය පර්යේෂකයන් ලබා ගැනීමේ හැකියාව ගවේශනය කිරීම.
- විශ්වවිද්‍යාල සමඟ සබඳතා ගොඩනඟා ගැනීම.
- වර්ෂාවසාන සම්මේලනයක් ඔස්සේ පර්යේෂණ සොයා ගැනීම් බෙද හැරීම.
- මිනිය හැකි කාර්යඵලය පදනම් කොටගත් ඇගයීමේ ක්‍රමයක් හඳුන්වාදීම.
- සේවා ස්ථානයෙන් පරිබාහිර ශාස්ත්‍රීය සමූහ සැසි සංවිධානය කිරීම.
- ප්‍රකාශනයන්ගේ මුද්‍රණ ගුණාත්මකභාවය ප්‍රවර්ධනය කිරීම.

**ක්‍රියාකාරකම්**

- අලෙවි තොරතුරු එක්රැස් කිරීම, විශ්ලේෂණය කිරීම හා බෙද හැරීම.
- වෙළඳපොළ ගැටළු විමර්ශනය කිරීම.
- පාරිභෝගික හැසිරීම විශ්ලේෂණය කිරීම.
- රජයේ සංවර්ධන වැඩසටහන් ඇගයීම.
- ගොවිජන සහ ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතීන් මෙන්ම වැඩසටහන් හි බලපෑම ඇගයීම.
- ව්‍යාපෘතිවලට අදළ මූලික අධ්‍යයනයන් සිදු කිරීම.
- කෘෂි ප්‍රතිපත්තීන් විශ්ලේෂණය කිරීම.
- යෝජිත සංවර්ධන ව්‍යාපෘතීන් පිළිබඳ ශක්‍යතා අධ්‍යයන පැවැත්වීම.

- කෘෂිකාර්මික යෙදවුම් සැපයුම සහ සහායක සේවාවන්ට අදාළ ගැටළු පිළිබඳ පර්යේෂණ කිරීම.
- ජල සම්පත් කළමනාකරණය සහ වාරි කෘෂිකර්මය පිළිබඳ පර්යේෂණ කිරීම.
- පාරිසරික සහ ස්වභාවික සම්පත් කළමනාකරණ ගැටළු අධ්‍යයනය කිරීම.
- වාරි ආයතන සහ ආයතනික ප්‍රතිපත්තීන් පිළිබඳ පර්යේෂණ කිරීම.
- ජාතික ප්‍රමුඛතාවය පදනම් කොටගත් පුහුණු වැඩසහටන්, වැඩමුළු සම්මන්ත්‍රණ සංවිධානය කිරීම.
- බාහිර ඉල්ලුම සපුරාලීම සඳහා විශේෂිත විෂයයන් පිළිබඳ පුහුණු වැඩසටහන් පැවැත්වීම.
- බාහිර නියෝජිතයාතන මඟින් සංවිධානය කරනු ලබන පුහුණු වැඩසටහන් සඳහා විද්වතුන්ගේ සහාය සපයාදීම.
- පුස්තකාල සහ ශ්‍රව්‍ය-දෘෂ්‍ය පහසුකම් ප්‍රවර්ධනය කිරීම.
- පර්යේෂණ සොයා ගැනීම් බෙද හැරීම සඳහා නවීන තොරතුරු තාක්‍ෂණය භාවිතය සවිමත් කිරීම
- කුශලතා සහ කාර්ය මණ්ඩල කාර්යක්‍ෂමතාව වර්ධනය කිරීම.
- දක්‍ෂතාව මත පුද්ගල හැකියාවන් පාදක කොටගත් බඳවා ගැනීම. ඇගයීම්, මාරු කිරීම් සහ උසස්වීම් ලබා දීම.

**සංවිධාන ව්‍යුහය**

ග්‍රාමීය සහ ගොවිජන සංවර්ධනය සම්බන්ධ විවිධ අමාත්‍යාංශ නියෝජිතයන්, දෙපාර්තමේන්තු සහ වෙනත් ආයතනවල නියෝජිතයන්ගෙන් සමන්විත පාලක මණ්ඩලයක් මඟින් ආයතනය පාලනය වෙයි. පාලක මණ්ඩලයේ සභාපති වශයෙන් කටයුතු කරනු ලබන්නේ කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍යාංශයේ ලේකම්තුමාය. ආයතනයේ ප්‍රතිපත්තිමය කරුණු සම්බන්ධයෙන් පාලක මණ්ඩලය විසින් වගකීම දරනු ලබයි. ආයතනයේ ප්‍රධාන විධායක නිලධාරියා වශයෙන් අධ්‍යක්‍ෂතුමා කටයුතු කරයි. නියෝජ්‍ය අධ්‍යක්‍ෂ (පර්යේෂණ) සහ ලේඛකාධිකාරි පිළිවෙලින් පර්යේෂණ හා පුහුණු වැඩසටහන් කළමනාකරණයට සහ පරිපාලනමය කටයුතු සඳහා අධ්‍යක්‍ෂතුමාට සහාය දක්වති.

වත්මන් අවධානයට ලක්වූ විෂය ක්‍ෂෙත්‍රයයන් පාදක කොට ගෙන ස්ථාපනය කළ අංශ 04ක් යටතේ පර්යේෂණ හා පුහුණු කටයුතු සිදු කෙරේ. කෙසේ වුවද, බොහොමයක් පර්යේෂණ සහ පුහුණු කටයුතු විවිධ අංශයන්ගෙන් තෝරාගත් පර්යේෂණ කණ්ඩායමක් මඟින් කරගෙන යනු ලබයි. ආයතනය තුළ පවතින පර්යේෂණ හා පුහුණු අංශ පහත සඳහන් වේ.

- කෘෂිකාර්මික ප්‍රතිපත්ති හා ව්‍යාපෘති ඇගයීම් අංශය
- පාරිසරික සහ ජල සම්පත් කළමනාකරණ අංශය
- අලෙවි, ආහාර ප්‍රතිපත්ති සහ කෘෂි ව්‍යාපාර අංශය
- මානව සම්පත් සහ ආයතනික සංවර්ධන අංශය

සෑම අංශයකම ප්‍රධානත්වය ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරීවරයෙකු විසින් දරනු ලබන අතර ඔහු විසින් එකී අංශයේ පරිපාලනමය කටයුතු සහ සමස්ත සම්බන්ධීකරණ කටයුතු පිළිබඳ වගකීම දරයි. එම අංශයන්ට සම්බන්ධ පර්යේෂකයන් සහ සහායක කාර්ය මණ්ඩලය වාර්ෂික සැලැස්ම ක්‍රියාවට නැඟීම සඳහා අංශ ප්‍රධානියාට සහාය වෙයි.

ආයතනයේ පරිපාලන කටයුතු පරිපාලන අංශයේ ප්‍රධාන ලේඛකාධිකාරි විසින් ඉටු කරයි. ඊට අමතරව, සහායක ඒකක දෙකක් පවතී.

- සංඛ්‍යාන හා දත්ත සැකසුම් ඒකකය
- ප්‍රකාශන ඒකකය

එම ඒකක මඟින් පිළිවෙලින් දත්ත සැකසුම් සහ ලේඛනගත කටයුතු කරනු ලබයි. සංඛ්‍යාන හා දත්ත සැකසුම් ඒකකය මඟින් එකම ස්ථානයකින් දත්ත සැපයීම සඳහා විවිධ මූලාශ්‍රයන්ගෙන් සමන්විත දත්ත ගබඩාවක් පවත්වාගෙන යනු ලබයි. කෘෂිකර්ම ක්‍ෂෙත්‍රයේ සංවර්ධනය සඳහා නවීනතම අංගෝපාංගයන්ගෙන් සමන්විත පුස්තකාලයක් ආයතනය සතුව පවතී.

**(පරිවර්තනය එස්.ඒ.සී.යූ. සේනානායක විසිනි)**